**ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2016**

---

ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල අතර 2012 ජනවාරි 30 දින එළඹි අංක I-857-LK දරන මූල්‍ය ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍යායනය ගිවිසුමට අනුව, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන් වේ. වාරිමාර්ග යටිතල පහසුකම්වල ඵලදායිතාවය හා තිරසාර කළමනාකරණය වර්ධනය කිරීම සහ ජලය හා ඉඩම්වල නිෂ්පාදන ධාරිතාවයේ තිරසාර වැඩි දියුණුව ළඟා කරගැනීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍යායනය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,782.43 කට සමාන එ.ජ.ඩො. මිලියන 29.32 ක් වූ අතර එයින් රු.මිලියන 2,819.77 කට සමාන එ.ජ.ඩො. මිලියන 22.23 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත. ඊට අමතරව රු.මිලියන 160 කට සමාන එ.ජ.ඩො. මිලියන 1.23 ක් හා පෞද්ගලික අංශය මගින් මූල්‍යායනය කිරීමට නියමිත අතර රු.මිලියන 351 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.70 ක් ප්‍රතිලාභීන් විසින් දායක වීමට අපේක්ෂිත විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජනවාරි 30 ආරම්භ කළ අතර 2017 මාර්තු 31 වනවිට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල් ව්‍යාපෘති සඳහා වන මාර්ගෝපදේශ වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයක් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධරණ ලෙස විශ්වාසය තැබිය හැකි වූයේද යන වග,

(ඉ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව,

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බවය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක සහ අවසාන ශේෂ විශේෂ (ඩොලර්) ගිණුමෙන් මුදල් ආපසු ලබාගැනීම් පිළිබඳව ව්‍යාපෘතිය පවත්වනු ලබන පොත්පත්වලින් සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්වන බව හා 2016 දෙසැම්බර් 31 දිනට ශේෂයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පොත්පත් සමඟ සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යායන ගිවිසුමට අනුව මූල්‍යායනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | | අරමුදල් උපයෝජනය සමාලෝචිත වර්ෂය තුළ | | අරමුදල් උපයෝජනය 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) |
| කෘ.සං.ජා.අ. | 22.23 | 2,819.77 | 7.80 | 1,125 | 7.66 | 1,117.25 | 16.77 | 2,315.00 |
| පුද්ගලික අංශ දායකත්වය | 1.23 | 160.00 | - | - | - | - | 0.01 | 0.58 |
| ප්‍රතිලාභීන්ගේ දායකත්වය | 2.70 | 351.00 | - | - | 0.03 | 4.34 | 0.16 | 21.40 |
| ශ්‍රී ලංකා රජය | 3.16 | 451.43 | 0.86 | 125 | 0.82 | 118.18 | 1.83 | 249.42 |
| එකතුව | 29.32 | 3,782.20 | 8.66 | 1,250 | 8.51 | 1,239.77 | 18.77 | 2,586.40 |

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

මූල්‍ය ගිවිසුමේ 4.1(b) උප වගන්තිය සහ උපලේඛන 1 ට අනුව ව්‍යාපෘතිය මගින් යටිතල පහසුකම් දියුණු කිරීම වශයෙන් කෘෂි ලිං ඉදිකිරීම, නල ලිං වැසි ජල ටැංකි සහ තවත් කුඩා ආකෘති ක්‍රියාත්මක කිරීම මගින් ඉරණමඩු ප්‍රදේශයේ ජීවත්වන ජනතාව අතර වැසි ජලය ඉතිරිකිරීමේ ක්‍රමවේදය ප්‍රචලිත කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික සැලැස්මට අනුව ව්‍යාපෘති කාලය තුල නල ලිං 60 හා කෘෂි ලිං 20 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද 2016 දෙසැම්බර් 31 දිනට නල ලිං 48 හා කෘෂි ලිං 18 ක් ඉදිකර තිබුණි. වැසි ජල ටැංකි ඉදිනොකිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘතිය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) භෞතික ප්‍රගතිය සම්බන්ධ වාර්තාවලට අනුව පැකේජ 232 ක් යටතේ, රු. මිලියන 2,370.56 ක කොන්ත්‍රාත් සම්බන්ධව ඉදිකිරීම් කටයුතු සඳහා (ඇලවල්, කාණු, ඇලපාර කෘෂි හා නලලිං වේලුම් බිම්, වී ගබඩා ආදිය) ප්‍රදානය කර තිබුණි. එයින් පැකේජ 64 ක් යටතේ වටිනාකම රු.මිලියන 287.74 ක් වූ ඉදිකිරීම් වැඩ 2016 දෙසැම්බර් 31 දින වන විටත් අසම්පූර්ණව පැවතිණි. තවද, පැකේජ 9 යටතේවූ ඉදිකිරීම් වැඩ 2016 දෙසැම්බර් 31 දිනට මාස 2 ½ සිට මාස 9 දක්වා පරාසය තුල කාල ප්‍රමාදයක් සහිතව සම්පූර්ණ කර තිබුණි. පැකේජ 5 ක් යටතේ ප්‍රදානයකර තිබූ ඉදිකිරීම, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වලතා මත කොන්ත්‍රාත්තුවේ අඩක් නිමකිරීමෙන් පසු අතහැරදමා තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය විසින් රාජ්‍ය නොවන සංවිධාන උපයෝගීකර ගනිමින් ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් පුහුණු සැසි, වැඩසටහන් හා වෙනත් අදාල හැකියා වර්ධන ක්‍රියාකාරකම් පවත්වා තිබූ බව නිරීක්ෂණය විය. 2016 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත පුහුණු සැසිවාර 351 ක් පමණක් පවත්වා තිබූබව අනාවරණය විය. තවද, ඒ සඳහා වැය කිරීමට ඇස්තමේන්තු කළ රු. මිලියන 86.44 කින් රු. මිලියන 41.31 ක් පමණක් 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. ඉතිරි රු මිලියන 45.13 ක් උපයෝගීකර ගනිමින් ඉතිරි වී ඇති මාස 3 ක කාලය තුල සැසි 110 ක් පැවැත්විය හැකි ද යන්න ඉතා අසීරු කාර්යයකි.

(ඈ) ලබා දී ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘතිය මගින් 2015 - 2016 කාලය තුල සංවිධානය කරන ලද ඉරණමඩු කෘෂිකාර්මික පද්ධතිය යටතේ ගොවීන් 229 දෙනෙක් ක්ෂේත්‍ර චාරිකා 6 ක් යටතේ මහවැලි H කලාපයට, තොග වශයෙන් ජලය බෙදාහැරීමේ පද්ධතිය පිළිබඳ පලපුරුද්ද ලබාගැනීමේ අදහසින් සහභාගී කරවා තිබුණි. කෙසේ වෙතත්, ඉරණමඩු වැවේ මූලික වැඩ "යාපනය කිලිනොච්චිය ජලය සැපයීම හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය නම් වූ ව්‍යාපෘතිය" නම් වූ ව්‍යාපෘතියක් මගින් සිදුකිරීමට නියමිතව තිබූ අතර, එය 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි. එබැවින්, තොග වශයෙන් ජලය බෙදාහැරීමේ පද්ධතිය නොතිබූ නිසා ක්ෂේත්‍ර චාරිකාවෙන් ලබාගත් පලපුරුද්ද යොදාගැනීමට ගොවීන්ට නොහැකි විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කළ වාරි මාර්ග සහ අනෙකුත් යටිතල ව්‍යුහයන් මෙහෙයුම් සහ නඩත්තුකිරීම පිළිබඳ සමාජ සංවිධාන වලට පුහුණුව ලබාදීම සඳහා රු. මිලියන 2.71 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් පුනරුත්ථාපනය කළ බෙදාහැරීමේ අදාල මාර්ග ගොවි සංවිධාන මගින් ක්‍රමවත්ව නඩත්තු නොකරන බව ක්ෂේත්‍ර පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. එම නිසා ව්‍යාපෘතියේ යටිතල ව්‍යුහයන්ගේ තිරසාරභාවය පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් උදාවී තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නල ලිං හා කෘෂි ලිං ඉදිකිරීම් සම්බන්ධ කොන්ත්‍රාත් 05 යටතේ ඉදිකිරීම් ඉඩම් කැබලි අත්පත් කර ගැනීම සහ ගොවි සංවිධානවල අනුමැතිය ලබාගැනීම ආදී වූ හේතු මත අදාල කොන්ත්‍රාත්කරුවන්ට භාර දී තිබුණේ මාස 2 සිට මාස 8 ½ දක්වා කාල ප්‍රමාදයක් සහිතව බව නිරීක්ෂණය විය.

(ආ) පරිචයක් වශයෙන් ව්‍යාපෘතිය විසින් සිවිල් වැඩ ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමේදී එයට ඇතුළත්කළයුතු විශාල වැඩ නොසලකාහැර තිබුණි. කෘෂි ලිං හා නල ලිං ඉදිකිරීම් සම්බන්ධව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම පිළිබඳ නියැදි විගණනයේදී පා කපාට සැපයීම හා ස්ථාපනය කිරීම ඇතුලත් කර නොතිබීම අනාවරණය වූ අතර එකකට රු.28,135 බැගින් විචලන නියෝග මත නල ලිං 5 වෙනුවෙන් ගෙවා නොතිබුණි.

(ඇ) කිලෝමීටර් 2.5 ක් වූ පරන්තන් ප්‍රධාන ඇල මාර්ගයේ ජලාපවාහන පද්ධතිය යටතේ පුනරුත්ථාපන වැඩ 2017 මැයි 31 දින දක්වා සම්පූර්ණකර නොමැති බැව් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය ඒ වෙනුවෙන් වැඩ නිම කිරීමේ සහතිකයක් නිකුත්කර තිබුණි.

3.4 මත භේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

ව්‍යාපෘතිය විසින් පවත්වාතිබූ වාර්තාවලට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන එක් එක් ප්‍රදේශය තුල ප්‍රතිලාභීන් 210 දෙනෙකු අතර කිරි එළදෙනුන් බෙදාදී තිබුණි. කෙසේ වෙතත් 2017 මැයි 30 දින සිදුකරන ලද විගණන පරීක්ෂණයේදී කන්දවෙලි සහ කරච්චි යන දිස්ත්‍රික් ලේකම් ප්‍රදේශය තුල ජීවත්වන ප්‍රතිලාභීන් 4 දෙනෙකුට කිරි එළදෙනුන් ලබාදී නොමැති බව ඔවුන් විසින් ප්‍රකාශකළ අතර ඔවුන්ගේ නම් එළදෙනුන් ලබා දුන් අයගේ නම් ලෙස ව්‍යාපෘති වාර්තාවේ ඇතුළත්කර තිබුණි.

3.5 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2012 වර්ෂයේ අනුමත කරන ලද සේවක සංඛ්‍යාව නිලධාරීන් 16 දෙනෙකුගෙන් සමන්විත විය. වාර 4 කදී සංශෝධනය කිරීමෙන් පසු ව්‍යාපෘතියේ අවසාන අදියරේදී අනුමත නිලධාරීන් සංඛ්‍යාව 82 ක් ලෙස හඳුන්වා දී තිබුණි. ව්‍යාපෘතියේ මූලික අදියර, සත්‍ය වශයෙන් අවශ්‍යවන මානව සම්පත් කළමනාකරණය කිරීමකින් තොරව, කාර්යයන් ක්‍රියාත්මක කිරීම සිදුකර ඇති බවට මෙය සාක්ෂිදරයි. තවදුරටත් 2016 අගෝස්තු 1 දින සිට මූල්‍ය උපදේශකයකු සේවයේ යොදවා ඇති අතර, රු.125,000 ක මාසික දීමනාවක් ගෙවීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.